# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PED/ චක්‍රලේඛ/2013
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2013.01.15

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංකඃ 01/2013

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය ව්‍යාපාර සභාපතිවරුන් වෙත

**<u>රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස</u>**

රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 12/1760/504/158 අනුව පහත සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව 2013.01.01 දින සිට එම විධිවිධාන ක්‍රියාත්මක වේ.

I. රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 ක් වන අතර කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 55 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වන අවුරුදු 60 දක්වා සේවයේ රැඳී සිටිය හැකිය.

II. අවුරුදු 55 සිට 60 අතර කාලපරිච්ඡේදය තුළ නිලධරයාගේ අභිමතය පරිදි පත්වීම් බලධරයා වෙත මාස 03 ක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව විශ්‍රාම යා හැකිය.

III. කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය සතුටුදායක නොවන නිලධාරියෙකුට වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීමක් ලබා නොදීමට පත්වීම් බලධරයා තීරණය කරන්නේ නම්, එයට එරෙහිව නිලධරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැලසෙන ආකාරයෙන් මාස 06 ක පූර්ව දැනුම්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධරයා සතු වේ.

රාජ්‍ය ව්‍යවසායන්හි ඉහළ කළමනාකරණ ශ්‍රේණිවලට අයත් නිලධාරීන් විශ්‍රාම යෑමේදී ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලසුම් පිළියෙල කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ පරිදි, අංක EA02/BC/PB/01 හා 1992.04.20 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය හා උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයේ (SEMA) 2004.12.17 දිනැති ලිපිය අනුව භාණ්ඩාගාර චක්‍රලේඛ අනුගමනය කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති රාජ්‍ය බැංකු සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවන අතර එම ආයතන වල සේවකයින්ගේ සේවා දීර්ඝ කිරීම් සම්බන්ධව තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි සිදුකල යුතුය.

රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධව මීට පෙර නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 මෙයින් අවලංගු වේ.

මේ සම්බන්ධව පැහැදිලි කිරීම් අවශ්‍යවන්නේ නම් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් (දු. අ. 2484617) හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දු. අ. 2484623) අමතා ලබා ගත හැකිය.

පී. බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්.

**පිටපත් :**

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති
4. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
5. අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව